දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපැල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ්අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல )
My No. ) DGHS/Circular/2016-127

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி )
Date ) 2016/02/10

# සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதார,போசணைமற்றும் சுதேசவைத்தியஅமைச்சு
# Ministry of Health, Nutrition& Indigenous Medicine

පොදු චක්‍රලේඛ අංක : 01 - 08 / 2016

සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් හා
රෝහල් අමාත්‍යාංශය යටතේ ඇති සියළුම ශික්ෂණ සහ
මහ රෝහල් අධ්‍යක්ෂවරුන් වෙත,

<u>වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා රෝහල් වලට ඇතුලත් කරනු ලබන භික්ෂූන් වහන්සේලා වෛද්‍ය පරීක්ෂණ සඳහා බාහිර ආයතන වලට යොමු කිරීම</u>

වෛද්‍ය ප්‍රතිකාර සඳහා රෝහල් ගතවන භික්ෂූන් හට නියම කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයන් බාහිර ආයතන මඟින් ඉටු කරවා ගැනීමේදී මුහුණ පෑමට සිදුව ඇති දුෂ්කර අවස්ථාවන් පිළිබඳව උන් වහන්සේලා විසින් ගරු බුද්ධශාසන අමාත්‍යතුමා වෙත වාර්තා කරනු ලැබ ඇත.

විශේෂයෙන්ම ආරණ්‍යගත සෙනසුන්හි වසන භික්ෂූන් වහන්සේ මුදල් පරිහරණය නොකරන බැවින්, මෙම තත්වය වඩාත් ගැටළුකාරී වන නිසා රෝහල් ගත භික්ෂූන් වහන්සේලා සම්බන්ධ වෛද්‍ය පරීක්ෂණයන් සිදු කිරීමේදී බාහිර ආයතන වලට යොමු නොකර රෝහල් මඟින්ම එය ඉටු කර දීම සඳහා විශේෂ අවධානය යොමු කරන ලෙස සියළුම රෝහල් ප්‍රධානීන් වෙත උපදෙස් ලබා දීමට ක්‍රියා කරන මෙන් බුද්ධශාසන ගරු අමාත්‍යතුමා විසින් මා වෙත දන්වා ඇත.

එබැවින් ගරු බුද්ධශාසන අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි රෝහල් ගතවන භික්ෂූන් වහන්සේලා සඳහා නියම කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයන් ඔබ ආයතන මඟින්ම ඉටු කර දීම සඳහා අදාල අංශ දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ඔබ වෙත මෙයින් දැනුම් දෙමි.

වෛද්‍ය පී. ජී. මහීපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:
1. ගරු සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා - කරු. දැ.ගැ.ස.
2. සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය ලේකම් - කරු. දැ.ගැ.ස.

Sp/-